# සැමුවෙල් හන්ටිංග්ටන් හා ජාතික චින්තනය

ලෝකයේ ඉහළ පෙළේ දේශපාලන විද්‍යාඥයකු හා චින්තකයකු ව සිටි සැමුවෙල් හන්ටිංග්ටන් මහතා පසුගිය දෙසැම්බර් මස විසිහතරවැනිදා මිය ගියේ ය. ඔහු මිය යන විට අසූඑක් වැනි වියෙහි පසු විය. ඔහු ගැන ලංකාවේ ද යම් උනන්දුවක් තිබූ බව රහසක් නො වේ. විශේෂයෙන් ම 1996 දී පළවූ ඔහුගේ ක්ලෑෂ් ඔෆ් සිවිලිසේෂන්ස් ඇන්ඩ් රිමේකින් ඔෆ් වර්ල්ඩ් ඕර්ඩර් හෙවත් සභ්‍යත්ව ගැටුම හා ලෝක පටිපාටිය නැවත නිර්මාණය කිරීම නමැති පොත එයට හේතුව විය. තමන්ට එතරම් නොතේරෙන පොත පත වැරදියට කියවන එක් පඬියකු නොබෝ දා මේ පොත හඳුන්වා දී තිබුණේ ලෝකයේ පළ වූ අධම පොතක් ලෙස ය. ඔහු සිතන අන්දමට පොතින් සභ්‍යත්ව අතර ගැටුම් ඇතිකර ගැනිමට රුකුල් ලැබෙයි. තවත් අයකු කලකට පෙර ඒ පොත දුටුවේ සභ්‍යත්වවලට ප්‍රශංසා කරමින් ලියූ එකක් ලෙස ය. ඒ ඒ අයගේ ඊනියා කියැවීමේ තරම එයින් ම පැහැදිලි වෙයි. හන්ටිංග්ටන් මහතා 1996 දී පොතක් වශයෙන් වර්ධනය කර ප්‍රකාශ කෙළේ 1993 දී ඒ මහතා ලිපියකින් පළ කළ අදහසකි. ඔහුගේ අදහස ඉතා සැකෙවින් මෙසේ ගොනු කළ හැකි ය. මෙතෙක් ලෝකයේ ඇති වූ ගැටුම් වෙළෙඳාම, භූමිය, මතවාද ආදිය පිරිවසා ජාතික රාජ්‍ය අතර වූ දෑ වෙයි. එහෙත් මින් මතු ආගම, ඉතිහාසය, භාෂාව, සම්ප්‍රදාය ආදියෙහි වෙනස්කම් මුල්කරගෙන යුද්ධ කෝළාහල ඇති වනු ඇත. හන්ටිංග්ටන් මහතා මේ අදහස් පළ කෙළේ සෝවියට් දේශයෙහි කඩා වැටීමෙන් උද්දාමයට පත්ව ෆුකුයාමා මහතා විසින් එන්ඩ් ඔෆ් හිස්ටරි හෙවත් ඉතිහාසයෙහි අවසානය යනුවෙන් ලියන ලද පොතෙහි අනාවැකිය වැරදි බව ද පෙන්වීම සඳහා ය. ෆුකුයාමා මහතාට අනුව බටහිර ලිබරල් වාදයට අනුවේ දශකයෙහි සිට අභියෝගයක් නො වී ය. එහෙත් හන්ටිංග්ටන් මහතා කියා සිටියේ ඉදිරියේ බටහිර සභ්‍යත්වයට වෙනත් සභ්‍යත්වවලින් විශේෂයෙන් ම මුස්ලිම් සභ්‍යත්වයෙන් තර්ජන එල්ල වන බව ය.

හන්ටිංග්ටන් මහතා ලෝකයේ විවිධ සභ්‍යත්ව කිහිපයක් ඇතැයි සඳහන් කෙළේ ය. එහෙත් ඔහු ථෙරවාද යනුවෙන් සභ්‍යත්වයක් ඇතැයි නො පිළිගත්තේ ය. සභ්‍යත්වයක් යනු බටහිර සමාජ විද්‍යාඥයන්ට අනුව මානව වර්ගයා යන පළල්ම එකතුවෙන් පසු මිනිසා වර්ග කළ හැකි විශාලතම පොදු කුලකය වෙයි. සභ්‍යත්වයක් විවිධ සංස්කෘතීන්ට බෙදිය හැකි ය. බටහිර සභ්‍යත්වය ඉංගිරිසි, ප්‍රංශ ආදී සංස්කෘතීන්ට බෙදා වෙන්කළ හැකි බව හන්ටිංග්ටන් මහතාගේ අදහස විය. බටහිරයන් බටහිරයන් ලෙස සිතුව ද මුස්ලිමුන් මුස්ලිමුන් ලෙස සිතුව ද ලෝකයේ ථෙරවාද බෞද්ධයෝ එකතුවක් ලෙස තමන් ථෙරවාදී බෞද්ධයන් ලෙස නො සිතති යන්න හන්ටිංග්ටන් මහතාට ථෙරවාදී සභ්‍යත්වයක් නැතැයි යන නිගමනයට එළඹීමට බලපෑ ප්‍රධාන හේතුව විය.

හන්ටිංග්ටන් මහතා ඉහත සඳහන් තම පොතෙහි එක් වාක්‍යයක ජාතික චින්තනය යන්න පාටික චින්තනය ලෙස වැරදියට සඳහන් කරයි. පසුගිය දා අතිශයෝක්තියෙන් ජේර ගෙඩියක පතෝල කරලක ප්‍රමාණය ගැන සඳහන් කරන එක් උගතෙක් හන්ටිංග්ටන් මහතා ජාතික චින්තනය ගැන පරිච්ඡේදයක් ම ලියා ඇතැයි ද ජාතික චින්තනය යන්න තමාට ද තේරුම් ගත නොහැකි සංකල්පයක් යැයි හන්ටිංග්ටන් මහතා තම පොතෙහි සඳහන් කර ඇතැයි ද කීවේ ය. අර උගතාගේ ජේර ගෙඩිවල තරම දන්නා අය පරිච්ඡේදයක් යනු වාක්‍යයක් බව තේරුම් ගන්නට ඇත. එහෙත් හුදී ජනයා ඒ කෙසේ තේරුම් ගත්තේදැයි නො දනිමි. හන්ටිංග්ටන් මහතා ජාතික චින්තනය ගැන එක් වාක්‍යයකින් සඳහන් කෙළේ ජාතික ව්‍යාපාර ගැන එක් නිදර්ශනයක් ලෙස පමණ ය. ජාතික චින්තනය යනු කුමක් දැයි ඉතා පැහැදිලිව කියා දිය හැකි තරුණයන් රාශියක් මේ වන විට බිහිවී ඇති බව ඒ උගතාගේත් ඔහුට හුම්ටි තැබූ අයගේත් දැන ගැනීම පිණිස සඳහන් කළ යුතු ය. ජාතික චින්තනයට බොරු පාරට්ටු අවශ්‍ය නො වේ.

හන්ටිංග්ටන් මහතාගේ අදහස් සමඟ අපි එකඟ නො වෙමු. විශේෂයෙන් ම සභ්‍යත්වය පාදක කරගෙන ලෝක ඉතිහාස විකාශයක් ගැන අපි කතා නො කරමු. ජාතික චින්තනය යන්න කුමක් දැයි අපේ විරුද්ධවාදියෝ එදා ඇසූහ. ජාතික චින්තනය පිළිබඳ අදහස් විකාශය වූ අන්දම අසවේ දශකයේ අග ද ඉන් පසුව ද දිවයින පුවත්පතෙහි කෙරුණු විවාදවලින් පැහැදිලි වෙයි. ඒ විවාද මුද්‍රිතව ඇති බැවින් කිසිවකුටවත් බේගල් ඇද බා ජාතික චින්තන අදහස් විකාශ වූ ආකාරය විකෘත කළ හැකි නො වේ. එරික් ෆ්‍රොම් මහතාගේ පොතක එන සෝෂල් කැරැක්ටර් යන්න ඊනියා සභ්‍යත්ව විඥානය ලෙස පරිවර්තනය කර ඒ ජාතික චින්තනය යැයි හැඳින් වූ පමණින් හන්ටිංග්ටන් මහතාගේ අදහස් ජාතික චින්තන අදහස් සමග සමපාත වන්නේ යැයි කිව නො හැකි ය. හන්ටිංග්ටන් මහතා පළ කර ඇති අදහස් හා අප පළ කර ඇති අදහස් අතර ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් වෙයි.

© Prof. Nalin De Silva

අප පදනම් වන්නේ ඊනියා සත්‍යත්වයක් මත නොව සංස්කෘතිය හා චින්තනය අතර ඇති සම්බන්ධය මත ය. මේ ඇතැම් අදහස්වල විකාශයෙහි එක් අවස්ථාවක් 1991 දී පළ කෙරුණු ජාතිය, චින්තනය හා සංස්කෘතිය නමැති පොතෙන් පිළිබිඹු වෙයි. එහි ඇත්තේ ඉන් අවුරුදු කිහිපයකට පෙර පළ වූ ලිපි එකතුවකි. හන්ටිංග්ටන් මහතා සත්‍යත්ව ගැටුමක් ගැන කතාකිරීමට අවුරුදු කිහිපයකට පෙර අපි සංස්කෘතිය හා චින්තනය ගැන කතා කෙළෙමු. 1982 පමණ ද අප චින්තනය යන සංකල්පය යොදා ගෙන ඇති බව දිවයින පත්‍රයෙන් හෙළිදරව් වනු ඇත. එහෙත් ඉන් කියැවෙන්නේ හන්ටිංග්ටන් මහතාගේ හා අපේ අදහස් අතර කිසිම සමීප බවක් නැති බව ද නො වේ. හන්ටිංග්ටන් මහතා කතාකරන්නේ පශ්චාත් සෝවියට් ලෝකයේ බල අරගලය ගැන ය. අප කතාකරන්නේ එක් අතකින් ගත්කල සංස්කෘතික ආක්‍රමණ, සංස්කෘතික යටත්විජිතවාද, සංස්කෘතික මිශ්‍රණ, දැනුම් නිර්මාණ, දැනුම් ආධිපත්‍ය ආදිය ගැන ය. ඒ පශ්චාත් සෝවියට් ලෝකයට පමණක් සීමා නො වෙයි. දඹදිව භාරතය බවට පත්වීමේ දී සිදු වූ සංස්කෘතික මිශ්‍රණය ගැන අපි මේ දිනවල විදුසර පත්‍රයේ සාකච්ඡා කරමු.

හන්ටිංග්ටන් මහතාගේ ලෝකය බටහිර පශ්චාත් පුනරුද ලෝකය වෙයි. ඔහු මෙතෙක් වූ යුද්ධ වෙළෙඳාම, භූමිය ආදිය මුල්කරගෙන වී යැයි සඳහන් කරන්නේ එබැවිනි. බටහිර වෙනත් උගතුන් මෙන් ම හන්ටිංග්ටන් මහතා ද ලෝක ඉතිහාසයේ ඒ ඒ යුගවල සිදු වූ විකාශ එක් එක් හේතුවට ඌනනය කිරීමට උත්සාහ කරයි. වත්මන් ලෝක විකාශය ඔහුට අනුව සත්‍යත්වය මත පදනම් වෙයි. කලින් වූ ලෝකය ආර්ථිකය හා දේශපාලනය මත පදනම් විය. එහෙත් අප ලෝකය දකින්නේ එක හේතුවාදීන් ලෙස නො වේ. සිංහල බෞද්ධ චින්තනය එක රේඛීය හෝ එක හේතුවාදී හෝ නො වේ. ඒ පටිච්චසමුප්පන්නවාදී වෙයි. අපට අනුව සමාජ විකාශය ආර්ථික, දේශපාලන හා සංස්කෘතික හේතු මත පදනම් වෙයි. එහෙත් මේ හේතු එකිනෙකින් වෙන් වූ දෑ නො වේ. පාරිභාෂික වචනයක් යොදාගන්නේ නම් ඒ අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර නො වේ. ඒවා එකිනෙකට බැඳී ඇත. එහෙත් ඇතැම් අවස්ථාවක ඒ සංරචක තුනෙන් එකක් හෝ දෙකක් හෝ සාපේක්ෂව බලවත් විය හැකි ය. අපට පශ්චාත් පුනරුද ලෝකයේ ද ඇතැම් විට බලවත් සංස්කෘතික සංරචකයක් විය. මාටින් ලූතර්, කැල්වින් ආදීන්ගේ ක්‍රියාකාරකම් වලින් පැහැදිලි වන්නේ ම බලවත් සංස්කෘතික ගැටුමකි. මැක්ස් වෙබර් මහතා මේ ප්‍රපංචය හන්ටිංග්ටන් මහතාට හෝ මාක්ස්වාදීන්ට හෝ වඩා සියුම් ව දුටුවේය යනු අපේ මතය වෙයි. වත්මන් ලෝකය සම්බන්ධයෙන් ගත්කල සංස්කෘතිය වඩාත් බලවත් සංරචකය වෙයි. අපේ බොහෝ ලිපිවල සංස්කෘතිය අවධාරණය කෙරෙන්නේ ඒ හේතුවෙන් මිස මාක්ස්වාදීන්ගේ ආර්ථිකය වෙනුවට අප සංස්කෘතිය ආදේශ කර සමාජ විකාශය සංස්කෘතියට ඌනනය කර ඇති බැවින් නො වේ. අප වත්මන් ලෝකය සම්බන්ධයෙන් සංස්කෘතික සංරචකය අවධාරණය කිරීම නිසා ඇතැමුන් ඒ හන්ටිංග්ටන් මහතාගේ සත්‍යත්ව ගැටුම සමග පටලවා ගැනීමට ඉඩ ඇත. එහෙත් අපේ විශ්ලේෂණයට ඊනියා සත්‍යත්වයක් අදාළ නො වෙයි.

හන්ටිංග්ටන් මහතා කෙසේ කිව ද, කතෝලික මුස්ලිම් ගැටුම් ඊනියා පුනරුදයට පෙර මෙන් ම පසුව ද තිබී ඇත. ඒ හුදෙක් ආර්ථික හෝ දේශපාලන හෝ ගැටුම් නො වී ය. අද ඇත්තේ කතෝලික නොවන ක්‍රිස්තියානි හා මුස්ලිම් ගැටුමකි. ඉරාකයේ දී සපත්තු පහරකට ලක්වන්නේ බුෂ් මිස ඉතාලි හෝ ප්‍රංශ හෝ කතෝලිකයකු නොවන බව අපි දනිමු. ක්‍රිස්තියානි සංස්කෘතිය කතෝලික සංස්කෘතිය පරදවා මුස්ලිම් සංස්කෘතියේ ප්‍රධාන සතුරා බවට පත් වී ඇත්තේ ලූතර් හා කැල්වින්ගේ ක්‍රියාකාරකම්වලින් පමණක් නොව පසුව එංගලන්තයේ හා ස්කොට්ලන්තයේ ඇති වූ ආර්ථික හා දේශපාලන හේතු ද නිසා ය. මාක්ස්වාදී දේශපාලනය මෙන් ම හිට්ලර්ගේ ෆැසිස්ට්වාදී දේශපාලනය ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පැරදවීමට කතෝලික සංස්කෘතිය ගත් අවසාන උත්සාහ සමග බැඳී ඇත. ඉතිහාසයේ සරදම වූයේ හිට්ලර්ට තම මස්සිනා වූ ස්ටැලින් හඳුනාගැනීමට නො හැකි වීම ය. දර්ශනය හෙගල් අත ම තිබියේ නම් හෝ මාක්ස් ඊනියා වාම හෙගල්වාදියකු නොවන්නට හෝ කතෝලික සංස්කෘතිය විසින් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පරදවනු ලැබීමට ඉඩක් තිබුණි. හන්ටිංග්ටන් මහතා පුනරුදයට පෙර කතෝලික මුස්ලිම් සංස්කෘතික ගැටුම් ගැන සාකච්ඡා නොකරන්නේ වත්මන් ලෝකයේ ඊනියා සත්‍යත්ව ගැටුම වෙනත් තලයකට ගෙන ඒමට බව පැහැදිලි ය. ඔහුගේ විශ්ලේෂණයට ථෙරවාදය හසු නොවීම ද අපේ අවධානයට ලක්විය යුතු ය. ඔහු ථෙරවාදය සත්‍යත්වයක් නොවේ යැයි පවසා ඉවත දැම්ම ද, බුෂ් එයට සුදානම් නැති බව ථෙරවාද රටවල කරන මැදිහත්වීම්වලින් පෙනී යයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva